# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2012/22 - 2017 මාර්තු මස 29 වැනි බදාදා - 2017.03.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : WLP/LAN/2/3/21

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2012/පීසී/172

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 394 බී පැනැටියන බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කර ඇති මූලික පිඹුරු අංක මාර 2597 හා 2015.04.28 දිනැති මූලික පිඹුරේ මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2642 ක් වූ පහත සඳහන් පරිදි සවිස්තරව පෙන්නුම් කෙරෙන ඉඩම් කැබලි තුන (03)

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: බෝපගෙවත්ත; විස්තරය: ක්‍රීඩා පිටිය; හිමිකම් කියන අය: පූජ්‍ය කනංකේ විමලඥාන හිමි, විහාරාධිපති, කනංකේ රජ මහා විහාරය, කනංකේ කඩවීදිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0045.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: බෝපගෙවත්ත; විස්තරය: ගෙවත්ත, තාවකාලික ගොඩනැගිල්ල, අවු. 30-40ක් වයසැති පොල් ගස් 3ක්, අවු. 40ක් වයසැති කොස් ගස් 1ක්, අවු. 20-30 ක් වයසැති කොස් ගස් 4ක්, අවු. 10ක් වයසැති අඹ ගස් 1ක්; හිමිකම් කියන්න අය: පූජ්‍ය කනංකේ විමලඥාන හිමි, විහාරාධිපති, කනංකේ රජ මහා විහාරය, කනංකේ කඩවීදිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0290.

03. **කැබලි අංක 03**

ඉඩමේ නම: බෝපගෙවත්ත; විස්තරය: වත්ත, අවු. 30ක්-40ක් වයසැති කොස් ගස් 3ක්, අවු. 30ක් වයසැති අඹ ගස් 1ක්, අවු. 5-10 ක් වයසැති පොල් ගස් 2ක්, අවු. 10ක් වයසැති ඇල්බීසියා ගස් 1ක්, අවු. 30ක් වයසැති දෙල් ගස් 1ක්, අවු. 10ක් වයසැති ඇට්ටෝනියා ගස් 1ක්; හිමිකම් කියන්නා: පූජ්‍ය කනංකේ විමලඥාන හිමි, විහාරාධිපති, කනංකේ රජ මහා විහාරය, කනංකේ කඩවීදිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0570.

ඉහත නම් සඳහන් ඉඩමට/ පරවශ්‍යතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2017.04.27 වැනි දින පෙ. ව. 10.00 ට වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද 2017.04.18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශ්‍යතාවට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

තුෂාරි පී. සූරියආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
වැලිපිටිය.

2017 මාර්තු මස 24 වැනි දින,
වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-301


1A - G 25345 - 19 (2017/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.